# 12 ශ්‍රේණිය ව්‍යාපාර අධ්‍යයනය 4 වන සතිය - මැයි 25 සිට 29 දක්වා

## විවිධ සන්නිවේදන ක්‍රම

සන්නිවේදන මාධ්‍ය පහත පරිදි වර්ග කෙරේ.

- වාචික මාධ්‍ය
- ලිඛිත මාධ්‍ය
- සංඥා හා සංකේත මාධ්‍ය

ව්‍යාපාර ආයතනයක සන්නිවේදනය සිදු වන ආකාරය අනුව පහත ආකාරයට ද වර්ග කළ හැකිය.

- අභ්‍යන්තර සන්නිවේදනය
- බාහිර සන්නිවේදනය

අභ්‍යන්තර සන්නිවේදනය යනු ව්‍යාපාර ආයතනය තුළ විවිධ පාර්ශව අතර තොරතුරු හුවමාරු කර ගැනීමය.

- අභ්‍යන්තර සන්නිවේදනයේදී,
- අයිතිකරුවන් - කළමනාකරුවන් අතර ,
- සේවකයින්-සේවකයින් අතර
- දෙපාර්තමේන්තු - දෙපාර්තමේන්තු අතර විවිධ තොරතුරු විවිධ තොරතුරු හුවමාරු වීම සිදුවේ.

බාහිර සන්නිවේදනය යනු ව්‍යාපාර ආයතනයක් ව්‍යාපාර ආයතනයෙන් බාහිර පාර්ශ්ව හා ආයතන සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමයි.

බාහිර සන්නිවේදනයේදී,

- ව්‍යාපාරය - ගනුදෙනුකරුවන් සමඟ
- ව්‍යාපාරය - වෙනත් ව්‍යාපාර,සැපයුම්කරුවන් අතර තොරතුරු හුවමාරු වීම සිදුවේ.

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1.)විද්‍යුත් සන්නිවේදනය යනු කුමක්ද?
2.)නවීන විද්‍යුත් සන්නිවේදන ක්‍රම 5ක් දක්වා ඒවා විස්තර කරන්න.
3.)සඵලදායී සන්නිවේදනයට ඇති බාධා 5ක් දක්වන්න.
4.)වාචික මාධ්‍ය ,ලිඛිත මාධ්‍ය ,සංඥා හා සංකේත යන මාධ්‍යවල වාසි අවාසි විශ්ලේෂණය කරන්න.